රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 19/2016

මගේ අංකය: EST-3/POLIC/04/0051
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2016.08.08

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>මැතිවරණ සඳහා ඉදිරිපත්වීමට රජයේ සේවයෙන් ඉල්ලා අස් වූ දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම</u>**

මැතිවරණ සඳහා ඉදිරිපත් වීමට රජයේ සේවයෙන් ඉල්ලා අස් වූ දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධරයන්ට නැවත රාජ්‍ය සේවයට පැමිණීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීමට 2016.07.12 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ 1:3 වගන්තියට පහත පරිදි 1:3:1 උප වගන්තිය ඇතුළත් කර සංශෝධනය කෙරේ.

1:3:1 මැතිවරණයකට තරඟ කිරීම සඳහා රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ තමන් දැරූ තනතුරෙන් ඉල්ලා අස්වූ හෝ විශ්‍රාම ලැබූ හෝ දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධරයකු නැවත රාජ්‍ය සේවයට / පළාත් රාජ්‍ය සේවයට පැමිණීම අපේක්ෂා කරන්නේ නම්, නිලධරයා අවසන් වරට සේවය කරන ලද අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳව තිරණය ගැනීමේ බලය අමාත්‍යාංශ ලේකම් සතුය. එසේම අමාත්‍යාංශ ලේකම්ගේ තීරණයෙන් තෘප්තියට පත් නොවන නිලධරයෙකුට තමන් අවසන් වරට සේවය කළ තනතුරේ පත්කිරීම් බලධරයා වෙත අභියාචනා කිරීමට හැක.

03. 2007.10.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2004(II) ක්‍රියාත්මක වීම නිසා අගතියට පත් නිලධරයන්ට ඉහත 02 ඡේදයෙන් ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයට ඇතුළත් කෙරෙන 1:3:1 උපවගන්තිය අනුව අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය